


## ඩෙවෝන් දියඇල්ල



ශ්‍රී ලංකාවේ දියඇලි අතරින් 19 වන ස්ථානයේ සිටින මීටර් 97 ක් උසැති මෙය නුවරඑළිය ඒ 7 මාර්ගයේ තලවකැලේ සිට කි.මී. 6 ක් බටහිරින් පිහිටා ඇත. නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ 20 වන සැතපුම් කණුව අසල පිහිටි රටගාල හා නැරඹුම් මැදිරිය ඩෙවෝන් ඇල්ලේ අසිරිය විදගත හැකි වඩාත් සුදුසු ස්ථානයක් ලෙස හැඳින්විය හැක.

## කන්දෙ ඇල ජලාශය



නුවරඑළිය හෝර්ටන්තැන්න මාර්ගයේ මීපිලිමානෙහි මනස්කාන්ත පරිසරයක ස්වභාවික වනාන්තරයක්ද සහිතව මෙම ජලාශය පිහිටා ඇත. නිල් පැහැති ජල ස්කන්ධයේත් කොළ පැහැති වනාන්තරයේත් සම්මිශ්‍රණයෙන් ගොඩනැගි ඇති නිසංසල පරිසරයක අසිරිය මෙහිදී විදගත හැකි අතර මෙම ජලාශය තුළ මසුන් ඇල්ලීම හා විනෝද බෝට්ටු සවාරි සේවාවක්ද ක්‍රියාත්මකය.

## වික්ටෝරියා උද්‍යානය



නුවරඑළිය නගර මධ්‍යයේ පිහිටා ඇති මෙම උද්‍යානය අක්කර 27 ක ප්‍රමාණයකින් යුක්ත වේ. ආවේණික හා සංක්‍රමණික වූ දුර්ලභ පක්ෂීන් හා දේශීය විදේශීය ශාක විශේෂ රැසකින් සමන්විත මෙම උද්‍යානය ග්‍රීස්ම සෘතුවේදී රෝස පුෂ්ප වලින් අලංකාර වේ.

## ලවර්ස් ලීප් දිය ඇල්ල



නුවරඑළිය නගරයේ සිට කි.මී. 2 ක් දුරින් කඳපොල මාර්ගයේ පිහිටි තරමක් කුඩා වුවත් ඉතා අලංකාරවත් මෙම ඇල්ල මීටර් 30 ක් පමණ උසකින් යුක්ත වේ. නුවරඑළිය නගරයට ඉතා ආසන්නව පිහිටි එකම දිය ඇල්ල වන මෙය දේශීය හා විදේශීය සංචාරකයන් අතර වඩාත් ප්‍රචලිතය.

## ග්‍රෙගරි වැව



නුවරඑළිය නගරයේ සිට කි.මී. 1 ක් දුරින් මාගස්තොට පිහිටි මෙය නුවරඑළියේ චමත්කාරජනක ආකර්ෂණ ස්ථානයක් ලෙස හැඳින්විය හැක. මෙය ආශ්‍රය කොටගෙන දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා බෝට්ටු සේවාවක්, සතුන්පිට යාමට හා පාපැදි පැදවීම සඳහා මංතීරුද ඉදිකර ඇති අතර මෙම ස්ථානයට ඉර බැසීමේ සුන්දර දර්ශනයේ අසිරියද විද ගත හැකි වේ.

## සඳතැන්න



නුවරඑළිය නගරයේ සිට කි.මී. 12 ක් දුරින් සීතාඑළිය බීජ අර්තාපල් ගොවිපල හරහා වැටී ඇති මාර්ගයේ විනාඩි 30 කින් පමණ ළඟාවිය හැකි මේ ස්ථානය උසින් අඩි 7500 ක් පමණ වේ. හෝර්ටන්තැන්න ජාතික වනෝද්‍යානයට සමාන පාරිසරික ලක්ෂණ වලින් සැදුම්ලත් මෙහි තුලු මී හරකුන්, ගෝනුන්, වලිකුකුළන්, මුවන්, වල් ඌරන්, මොනරුන් හා කුරුළු විශේෂ රාශියකගේ නිවහනක් වේ.

# වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව

### මධ්‍යම පළාත



මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ප්‍රධාන කර්මාන්තයක් බවට මෙකල පත්ව ඇත. මෙය පුංචි එංගලන්තය නමින් ප්‍රකට සුන්දර නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සංචාරක කර්මාන්ත සංවර්ධනය හා ප්‍රවර්ධනය අරමුණු කොට ගෙන මධ්‍යම පළාත් වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව මඟින්, සංචාරක ආකර්ශන ස්ථානයන් කිහිපයක් ඇතුළත් කරමින් 2014 නුවරඑළිය වසන්ත උදාන සැනකෙළියට සමගාමීව සකස් කල තිළිණයකි.


වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව
අංක 1054, ගැටඹේ, පේරාදෙණිය.
දුරකථන / ෆැක්ස් : 081 - 2387118
ඊමේල් : tradecomtourcpc@gmail.com
වෙබ් අඩවිය : www.tourism.cp.gov.lk


සංචාරක ආකර්ශන ස්ථානයන් සම්බන්ධව
කඳුරට ගුවන් විදුලි සේවයේ 107.5, 90.1, 107.3
ඔස්සේ දිනපතා
පෙ.ව. 6.40 ට විකාශය වන
නොදුටු මංපෙත්
වාර්තාමය වැඩසටහනට සවන් දෙන්න.

# නුවරඑළිය දිස්ත්‍රික්කයේ නැරඹිය හැකි සුන්දර ස්ථානයන් කිහිපයක්



## හෝර්ටන් තැන්න

නුවරඑළිය නගරයේ සිට කි.මී. 32 ක් දුරින් අඹේවෙල හරහා පට්ටිපොල මාර්ගයේ පිහිටා ඇති මෙය ලංකාවේ උසම තැන්නේ හෙක්ටයාර් 10000 ක වපසරියකින් යුත් වනෝද්‍යානයකි. මෙය ශ්‍රී ලංකාවට ආවේණික හා සංක්‍රමණික සත්ත්ව විශේෂයන්ගේ පාරාදීසයක් වන අතර 2010 දී ලෝක උරුම ස්වභාවික වනෝද්‍යානයක් ලෙසද නම් කර ඇත.

## කොත්මලේ මහවැලි මහා සෑය





කොත්මලේ නව නගරය හරහා දිවෙන මාර්ගයේ කඩදොර නැරඹුම් මධ්‍යස්ථානය අසලින් ඉහළට ඇති මාර්ගය ඔස්සේ මෙම සෑය වෙත ළඟාවිය හැක.

මෙහි විශේෂත්වය වන්නේ රුවන්වැලි මහා සෑයට පමණක් දෙවැනි වන අඩි 289 ක් උසින් යුක්ත බුබ්බුලාකාර හැඩයයි.

## සීතා අම්මාන් කෝවිල



නුවරඑළිය වැලිමඩ මාර්ගයේ කි.මී. 5 ක් දුරින් හක්ගල උද්භිත උද්‍යානයේ සිට කි.මී. 1 ක් පමණ දුරින් පිහිටි මෙම කෝවිල ඓතිහාසික රාම සීතා කතා පුවත හා බැඳී පවතින අතර මෙය දේශීය හා විදේශීය හින්දු බැතිමතුන්ගේ ආකර්ශනයට බඳුන් වන ස්ථානයක් ලෙසද හැඳින්විය හැක.

## හෝලි ට්‍රිනටි දේවස්ථානය



1852 පෙබරවාරි 24 වන දින රෙජිමන්ට් සහ කෝප්‍රල් මෝ යන දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පීන්ගෙන් නිමවුණු මෙම දේවස්ථානය නුවරඑළිය නගර මධ්‍යයේ පිහිටා ඇති පූජනීය ස්මාරක වලින් යුත් ස්ථානයකි. ඉංග්‍රීසි පාලන අවදියේ නාවික හා පාබල සොල්දාදුවන් විශාල ප්‍රමාණයකගේ සොහොන් කොත් හා සිහිවටන ස්මාරක අදටත් මෙහි දැකගත හැක.

## ලක්ෂපාන දිය ඇල්ල



හැටන් මාර්ගයේ දියගල හන්දියෙන් නෝර්ටන් පාර ඔස්සේ මස්කෙළිය මාර්ගයේ 4 කණුව අසලින් දකුණට හැරී කොත්තැල්ලෙන ගම්මානයේ මෙම මනස්කාන්ත දිය ඇල්ල පිහිටා ඇත. ජෛව විවිධත්වයකින් යුත් මෙහි ජපන් කොරලි, ලූලන්, ආඳන් වැනි මත්සයින් සුලභව දක්නට ලැබේ.

## හක්ගල උද්භිත උද්‍යානය



මධ්‍ය කඳුකරයේ උසම ස්ථානයක් වන හක්ගල කඳු වැටිය පාමුල පිහිටා ඇති මෙය නුවරඑළියේ සිට කි.මී. 10 ක් දුරින් බදුල්ල, වැලිමඩ මාර්ගයේ පිහිටා ඇත. මෙහි දුර්ලභ ගනයේ ශාක විශේෂයන් දක්නට ඇති අතර නමුණුකුල කඳුවැටියද මනාව දර්ශනය වේ.

## පිදුරුතලාගල රක්ෂිතය



ශ්‍රී ලංකාවේ උසම කඳුවැටිය වන මෙය නුවරඑළිය නගරයේ සිට කි.මී. 7 ක් දුරින් පිහිටා ඇත. කඳු මුදුන මීටර් 2524 ක් උස වන අතර මුහුදු මට්ටමේ සිට අඩි 8292 ක උසකින් පිහිටා ඇත. මෙය ලෝකයේ ඉතාමත් ආකර්ශනීය හා මනස්කාන්ත රක්ෂිතයක් ලෙස හැඳින්විය හැක. ඇබර්ඩීන්, ලක්ෂපාන, සෙන්ට්ක්ලෙයාර්ස් හා ඩෙවෝන් වැනි දිය ඇලි කිහිපයක්ම මෙම කඳු මුදුනෙන් ආරම්භ වෙයි.

## මේරායා වැව



නුවරඑළිය නානුඔය මාර්ගයේ කිර්මැට්ටිය මාර්ගයට හැරී කි.මී. 6 ක් ගමන් කළ පසු මේරායා වත්ත මධ්‍යයේ මෙම වැව පිහිටා ඇත. ස්වභාවිකව නිර්මාණය වී ඇති මෙය දිගින් මීටර් 150 ක් හා පළලින් මීටර් 200 ක් පමණ වන අතර මෙහි අවට ඉතා දැකුම්කලු පරිසරයක් ගොඩනැගී ඇත. විවිධ වර්ගයේ සමනල් විශේෂයන් මෙහිදී නැරඹිය හැකි අතර ආසන්නයේ පිහිටා ඇති හින්දු කෝවිල මගින් අවට සුන්දරත්වය වඩාත් තීව්‍ර කරයි.